# ලෝකාලෝකය

2022 අප්‍රේල් - ජූනි කලාපය

## ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
## කෙරෙහි අදහාගන්න,
## එවිට නුඹ ගැළවෙන්නෙහිය.
## නුඹද නුඹේ ගෙදර අයද
## එසේම ගැළවෙන්නේය
## (ක්‍රියා 16:31)

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901




# යේසුස්වහන්සේ කවුද?

ආදරණීය දුවේ, පුතේ, කොහොමද ඉතින් ඔයාලට? දෙවිපියාණන්ගේ ප්‍රේමයෙහි සහ මඟපෙන්වීමෙන් ඔයාල හැම කෙනෙක්ම ඉතා හොඳින් කාලය ගත කරන නිසා අපි දෙවිපියාණන්ට ස්තූති කරමු. දුවේ පුතේ ඒකාකාරීව ගත කළ කාලයෙන් මිදිලා සාමාන්‍යය ජීවන රටාවට නැවතත් යොමු වීමට ලැබීම මහඟු සතුටක් නේද? ඉතින් මේ අලුතින් ලැබෙන නිදහස භුක්ති විඳින ගමන් අපේ පාපයෙන් අපව ගලවා මුදවා පාපයේ බලයෙන් අපව නිදහස් කරගත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කවුද? යන්න පිළිබඳව අපි අද සොයා බලමු.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ බෙත්ලෙහෙමේ උපත ලද **(මතෙව් 1:18 - 2:12)** නාසරෙත් හී හැදී වැඩුණු බව ඔබ දන්නා කරුණක්. යේසුස්වහන්සේගේ ළමා කාලය අනෙක් ළමුන් මෙන් ගත කළ බව **ලූක් 2:52 "ප්‍රඥාවෙන් හා උසමහතින්ද, දෙවියන්වහන්සේ හා මනුෂ්‍යයන්ගෙත් කරුණාවෙහිද වැඩුණු සේක"** හී සඳහන් කර තිබේ. එලෙසම උන්වහන්සේ මෙලොවට පැමිණි පසු උන්වහන්සේ සියයට සියයක්ම මනුෂ්‍යයෙක්ව සිටිසේක. දුවලා පුතාලා කියවල තියෙනවද උන්වහන්සේට බඩගිනි වුණ බව, වෙහෙස දැණුන බව, උන්වහන්සේ දුක හිතිල අඬපු බව **යොහාන් 4:6, මාර්ක් 4:38, යොහාන් 11:35** පද කියවල මේ අවස්ථාවන් ගැන සම්පූර්ණ කතාන්දරය දැනගන්න පුලුවන්. ඒ වගේම තමයි දුවේ පුතේ යේසුස්වහන්සේ සියයට සියයක්ම මනුෂ්‍යයෙක්ව සිටියත් උන්වහන්සේ කිසිම පාපයක් නැතිව සිටියා. **හෙබ්‍රෙව් 4:15** හි සඳහන් වෙනවා උන්වහන්සේ මනුෂ්‍යයන් මෙන් පරීක්ෂා කරනු ලැබුවත් කිසිම පාපයක් නොකළ බව.

ඒ වගේම තමයි දුවේ පුතේ, යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා. ඒ තමයි උන්වහන්සේගේ දේවත්වය. උන්වහන්සේ මුහුද සහ සුළඟ කෙරෙහි උන්වහන්සේගේ බලය ප්‍රකාශ කළා **(මතෙව් 14:22-33)**. එලෙසම බොහෝ හාස්කම් කළා. මේ සියල්ල කළ හැක්කේ උන්වහන්සේගේ බලයෙන්ම පමණයි. යේසුස්වහන්සේට පදවි නාම බොහෝ ගණනක් තිබෙනවා. දේව පුත්‍රයාණෝ, මනුෂ්‍යය පුත්‍රයාණෝ, ගැළවුම්කාරයාණෝ, ස්වාමීන්වහන්සේ, ගුරුතුමාණෝ මේවායින් කිහිපයක්. ඉතින් දුවේ පුතේ මේ යේසුස්වහන්සේට පුලුවන් ඔබේ පව් වලට සමාව දෙන්න. ක්‍රිස්තුස්වහන්සේ මේ පොළවට පැමිණීමට හේතුව තමයි ඔබටත් මටත් ජීවනය ලබා දීම. **(යොහාන් 10:10)** යේසුස්වහන්සේ කුරුසිය මත මරණයට පත්වෙමින් ඔබෙත් මගෙත් පාපයට අවැසි දඬුවම විඳ ගත්සේක. ඉතින් දුවේ පුතේ හොඳින් මතක තබා ගන්න.

1. යේසුස්වහන්සේ සියයට සියයක් මනුෂ්‍යයෙක්ව පොළොවේ ජීවත් වුණා.
2. එලෙසම පාපයක් නැතුව සිටියා.
3. දෙවියන්වහන්සේගේ පුත්‍රයාව සිටියා.

ඊළඟ කලාපයේදී යේසුස්වහන්සේ ගැන තව දුරටත් ඉගෙන ගනිමු. යේසු පිහිටයි!

ආදර,

**- ශෂිලා නැන්දා -**

# නුඹලා පොළොවේ ලුණුය
## (මතෙව් 5:13)



යේසුස්වහන්සේ එදා තමා අනුගමනය කළ අයට දුන් එක් විරුදාවලියක් ලෙස ඉහත ප්‍රකාශණය සඳහන් කළ හැක. අද ද තම ගැලැවුම්කරුවා හා ස්වාමින්වහන්සේ ලෙස උන්වහන්සේව විශ්වාස කර ගැලවීම නොහොත් නැවත ඉපදීම ලබා ඇති අප සැවොම පොළොවේ ලුණු ලෙස හැදින්විය හැක. ඒ තුල යම් සැගවුණු අදහසක් ඇති බව පෙනේ. ඒ සඳහා ලුණු වල ඇති ගති ලක්ෂණ කිහිපයක් සලකා බලා අපි අපගේ ජීවිත වලට එය අදාල කර ගැනීමේ උත්සහයක යෙදෙමු.

### 01. ලුණු රසය

ලුණු වල අඩංගු ඊට ආවේනික රසය අති ප්‍රබලය. එම රසය අඩංගු ලුණු වල පමණි. එය ලුණු රසය නම් වේ. ඇදහිලිවන්තයා තුල අඩංගු නොහොත් සැගවී ඇති මෙම රසය මම ශුද්ධාත්මයණන් ලෙස හැදින්වීමට කැමතිය. උන්වහන්සේ නුඹලා තුලෙහි සිටින සේක. **(යොහාන් 14:17)** සෑම කිතුණු ඇදහිලිවන්තයෙකු තුලම ශුද්ධාත්මයාණන් වැඩ සිටින සේක. මුළු අලුත් ගිවිසුම පුරාවටම මෙම සත්‍යය තහවුරු කර ඇත. තව කෙනෙකුගේ ජීවිතය රසවත් කිරීම නොහොත් යහපත් ආකාරයට බලපෑමක් ඇති කිරීමට ඇදහිලිවන්තයාට හැකියාව ලැබී ඇත්තේ තමා තුල වැඩ සිටින ශුද්ධාත්මයාණන් නිසාය.

### 02. ලුණු වල වර්ණය.

ලුණු වල වර්ණය නොහොත් පාට සුදුය. සුදු වර්ණය හැම විටම පිරිසිදුකම , පවිත්‍රතාවය, ශුද්ධකම පිළිඹිබු කරයි. මෙම වර්ණය ඇදහිලිවන්තයන්ට ආදේශ කරන විට ඔවුන්ගේ පවිත්‍රතාවය ලෙස හැදින්වීමට මා කැමතිය. නුඹලා පවිත්‍රය. **(යොහාන් 13.10)** නැවත ඉපදීම ලැබූ සෑම කෙනෙක්ම යේසුස්වහන්සේ විසින් මුළුමනින්ම පවිත්‍ර කර ඇත. " නෑවාවූ තැනැත්තේ මුළුමනින්ම පවිත්‍රය." එම පදයෙහිම උන්වහන්සේ සඳහන් කර ඇත. "ඕනෑ කරන්නේ පාද සේදීම පමණක්ය." තවද එහි සඳහන් වේ. එනම් දිනපතා තම ජීවිතය සෝදිසිකර පසුතැවිලි වී සමාව ලබා ගැනීම පමණි. නමුත් උන්වහන්සේ අපව කැඳවා තිබෙන්නේ ශුද්ධ ජීවිතයක් ගත කිරීම සඳහාය. **"මා ශුද්ධව සිටින්නාක් මෙන්**

**නුඹලාත් ශුද්ධව සිටපල්ලා" (1 පේතෘස් 1:15-16).** අප හැමවිටම ශුද්ධ ජීවිතයක් ගත කළ යුතු බව මෙහිදි අපට මතක් කර දෙයි.

## 03. ලුණු වල ස්වභාවය දියවන සුළුය.

ලුණු වල තියෙන තවත් ගති ලක්ෂණයක් වන්නේ දියවන සුළු ගතියය. ඉබේම දිය වී යයි. ඇදහිලිවන්තයා තුළ තිබිය යුතු අහිංසකත්වය නොහොත් මෘදු මොළොක් හදවත මෙයින් අදහස් වන්නේ යැයි මම සිතමි. මක්නිසාද අපගේ ස්වාමින්වහන්සේ **"මම සිතින් මෘදුව යටහත්ව සිටිමි" (මතෙව් : 11:29).** හි පවසයි. දේව දරුවන් බයිබලයේ හඳුන්වන්නේ බැටළුවන් ලෙසය. බැටළුවා හරි අහිංසක සතෙකි. විශේෂයෙන්ම අන් අයට හිංසා පීඩා, කරදර, නොකරයි. තමන්ට සිදුවන පීඩාව දරා ගනී. එමෙන්ම අන් අයට කොන්දේසි විරහිතව උපකාර කරයි. එනම් ක්‍රිස්තු චරිතය සහිත ජීවිතය. **(1 යොහාන් 2:6 )** නපුරු කමින් පරාජය නොවී යහපත් කමින් නපුර පරාජය කිරීම **( රෝම 12:21)**

## 04. ලුණු ස්වල්පයකි. සුළුතරය.

ලුණු අප කෑමට යොදන්නේ ඉතාම ස්වල්පයකි. මෙහි අර්ථය ලෙස සිතිය හැක්කේ ඇදහිලිවන්තයන්ගේ ප්‍රමාණය නොහොත් සංඛ්‍යාත්මක ගණනයි. කිතුණු ආගම ලොව පුරා පැතිර් තිබුනත් සැබෑ ලෙස නැවත ඉපදීම ලබා ඇත්තේ ඉතා සුළු කාණ්ඩයකි. එය යේසුස්වහන්සේගේ සභාව ලෙස හැදින්වේ. **"කුඩා රැළ භයනොවෙල්ලා" (ලූක් 12:32).** ස්වාමින් වහන්සේ පැවසූ සේක. මෙහි "කුඩා රැළ" ලෙස හදුන්වනු ලබන්නේ මේ පොළොවේ සිටින සැබෑ ඇදහිලිවතුන්ය. ලෝක ජනගහනයට සාපේක්ෂව එය ඉතාම කුඩා කණ්ඩායමකි.

## 05. ලුණු විෂබිජ නාශකයකි.

ලුණුවල ඇති තවත් ගති ලක්ෂණයක් වන්නේ ඒ මගින් පිරිසිදු කාරකයක් ලෙස ක්‍රියා කිරීමයි. මේ මගින් ඇදහිලිවන්තයාගේ සේවය වන පාපය පහකිරීම නොහොත් සුභාරංචිය ප්‍රකාශ කරමින් පාපයෙන් නරක් වී කුණු වී ඇති හදවත් පවිත්‍ර කරමින් ජීවිත අලුත් කිරීම අදහස් වේ. **"සකල ජාතීන්ට සුභාරංචිය ප්‍රකාශ කරපල්ලා"** යන උන්වහන්සේගේ අණට කීකරු වීම තුලින් අපට මේ ලෝකයේ ලුණු බවට පත් විය හැක. ඔබත් මමත් මේ ලෝකයේ ලුණු ලෙස ක්‍රියා කිරීම. ජීවත් වීම දෙවියන්වහන්සේගේ කැමැත්තයි. ශුද්ධාත්මයෙන් පූර්ණව, ක්‍රිස්තුස්වහන්සේගේ චරිතය සහිතව උන්වහන්සේගේ සභාව ලෙස සුභාරංචිය ප්‍රකාශ කරමින් අන් අයගේ ජීවිත රසවත් කිරීම හා ඔවුන් නිරයෙන් ගලවා ගැනීම මඟින් අපට මේ සමාජයේ ලුණු බවට පත් විය හැක. එසේ කිරීමට දෙවියන්වහන්සේ ඔබටත් මටත් උපකාර කරන සේක්වා.

- සංස්කාරක -

**එස්. මෙත්තානන්ද**

**077 8813197**




# මිදිවත්තේ කතාව

## (මතෙව් 20:1-16 ඔබගේ බයිබලයෙන් කියවන්න)

යේසුස්වහන්සේ තවත් උපමාවක් කියමින් තම ගෝලයන්ට දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳ ප්‍රතිපත්තියක් ඉගැන්වූ සේක. මෙම උපමා කතාවේ ස්වාමියා දෙවියන් වහන්සේය. වැඩකාරයන් වන්නේ ලෝකවාසී ජනතාවය. මෙහි මස්ස නොහොත් වැටුප ලෙස හඳුන්වන්නේ ගැලවීම නොහොත් සදාකාල ජීවනයයි. මෙම අදහස එක් අදහසක් වන්නට පුළුවන. මෙම උපමාවේ තවත් අදහසක් තිබිමට හැක. පළමු පැයේ (උදේ 6.00) වැඩට ගත් අයද, තුන් වන පැයේ (උදේ 9.00) වැඩටගත් අයද, හයවන පැයේ (දවල් 12.00) වැඩට ගත් අයද,නව වන පැයේ (හවස 3.00) වැඩටගත් අයද අවසාන ලෙස 11 වෙනි පැයේ (හවස 5.00) වැඩට ගත් අයද මෙහි සඳහන් වේ. එනම් ළමාකාලයේදී , තරුණ වයසේදී, මැදි වයසේදී නැත්නම් තම ජිවිතයේ අවසාන කාලය නොහොත් මහලු කාලයේදී ගැලවීම ලබා දේව දරුවන් බවට පත් වන අය මෙයින් අදහස් වේ යැයි මම සිතමි. නමුත් කුමන වයසේදී දෙවියන්වහන්සේ මනුෂ්‍යයන් කැඳ වාගත්තත්, කොපමණ කාලයක් ඇදහිලිවන්තයෙකු ලෙස ජීවත් වුවත් ඒ හැම කෙනාටම ගැලවීම, සදාකාල ජීවනය නොහොත් මරණින් පසු දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීමට වරප්‍රසාදය ලබා දේ. ඕනෑම මනුෂ්‍යයකු දෙවියන්වහන්සේගේ සදාකාල රාජ්‍යයට ඇතුල් වන්නේ උන්වහන්සේගේ ප්‍රසාදය නොහොත් අනුග්‍රයෙනි. එනම් නොමිලේය. **(එපීස 2:8)** සදාකාල ජීවනය උපයාගත නොහැක. මෙහිදී සවස 6.00 ට පමණ වැටුප් ගෙවීම ආරම්භ වු අතර සමහරු පැය 12ක්, සමහරු පැය 9 ක්. සමහරු පැය 6ක්, සමහරු පැය 3ක් හා සමහරු පැය 1ක් බැගින් සේවයේ යේදී තිබුණි. පළමු වැටුප් ගෙවිවේ එක පැයක් වැඩ කළ අයටයි. ඔවුන්ට මස්සක් (උදා. රු 1000.00) ලැබුණි. එවිට වැඩි පැය ගණනකින් වැඩ කළ අය සිතුවේ අපිට වැඩියෙන් ලැබේ යැයි කියාය. නමුත් පැය 12 ක් වැඩ



කළ අයට ලැබුනේ එක මස්සක් (රු 1000.00) පමණි. මෙහිදි යම් ගැටළුකාරී තත්වයක් ඇති විය. පැය 12 වැඩ කළ අය හා වැඩිවෙලාවක් වැඩ කළ අය කොඳුරන්ට පටන් ගන්නවා. එනම් එක පැයක් හා අඩු පැය ගණනක් වැඩ කළ අයටත් එකම වැටුප ගෙවීමෙන් තමන්ට අසාධාරණයක් වූ බව සිතමිනි. එහෙත් ස්වාමියා ඔවුන්ට පොරොන්දු වු වැටුප ගෙවූ (2 පදය) බව පැහැදිලි කර දුන්නේය.



## අසාධාරණයද ? ඊර්ෂියාවද ?


මෙහිදි පොරොන්දු වූ වැටුප ගෙවීමට ස්වාමියා ධර්මිෂ්ඨ වු අතර මුළු දවසම තමන් කුලියට ගන්නා තෙක් බලා හිඳ අඩු පැය ගණන් වැඩ කළ පුද්ගලයන්ද මුළු දවසේම වැටුප ගෙවීමට ස්වාමියා ත්‍යාගශීලී විය. මෙහිදි අසතුටට පත් වු පිරිස කෙදිරුවේ තමන්ට අසාධාරණයක් වු නිසා නොව තමන්ට වඩා අන් අයට ලැබීම කරණකොටගෙන හටගත් ඊර්ෂ්‍යයාව නිසාය. දෙවියන් වහන්සේගේ අනුග්‍රහය හා කරුණාව තමන් කැමති විදියට උන්වහන්සේ බෙදා දෙන සේක. **(රෝම 9:18-21)** බලන්න. එහෙත් උන්වහන්සේ කැඳවන කිසිවෙකුට අසාධාරණයක් නොකරන සේක. උන්වහන්සේගේ සේවය තුලද මෙම සත්‍ය එසේමය. බොහෝ වෙහෙස මහන්සි වී බොහෝ කාලයක් සේවය කිරීම හා බොහෝ කාලයක් සේවය කිරීමට සුදානම්ව සිට අවසාන කාලයේ කුඩා සේවයක් විශ්වාසවන්තව කිරීමත් එක සමාන ඉටු විපාක ලැබෙන කාර්යයකි. මෙය දේව රාජ්‍යයේ ප්‍රතිපත්තියකි. දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ප්‍රතිපත්ති, දේශපාලනික ආර්ථික, කළමනාකරණ මනෝ විද්‍යාව හෝ මේ ලෝකයේ තිබෙන ඕනෑම ප්‍රතිපත්ති, නිති රීති අභිබවා යන වෙනස්ම වූ ප්‍රතිපත්ති සමුදායකි. සියල්ල දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍යය බලය හා කරුණා අනුග්‍රහය මත පදනම් වී ඇත. උන්වහන්සේගේ දරුවන් හා සේවකයන් හැටියට අප මේ ගැන දැනුවත් වීම හා අවබෝධකර ගැනීම හොඳ ශක්තිමත් කිතුණුවන් වීමට මහෝපකාරි වේ.

**- ජීවන හඬ -**

# යේසුස්වහන්සේ මෙන් කීකරුවන්න

ප්‍රිය සහෝදර සහෝදරියනි, මම ඔබෙන් කීකරුකම යනු කුමක්දැයි ඇසුවොත් ඔබ එය නිර්වචනය කරන්නේ කෙසේද? ඔබ බොහෝදෙනෙක් එය, " කීකරු වීමට ඇති පූර්ණ කැමැත්ත එනම් සිය කැමැත්තෙන්ම කීකරුවීම" ලෙස නිර්වචනය කළොත්, එය සනාථ කිරීමට ඔබට දිය හැකි හොඳම සහ ගැළපෙනම උදාහරණය කුමක්ද? ඔබට මට හෝ වෙන ඕනෑම කෙනෙකුට ලබා දිය හැකි එකම සහ සම්පූර්ණ පිළිතුර, උදාහරණය වන්නේ, යේසුස්වහන්සේයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට පැමිණ ඔබ හා මා උදෙසා අපේ පව් උදෙසා කුරුසියේ මරණය විඳ, වළලනු ලැබ, මරණින් නැගිට දෙවියන්වහන්සේ සමඟ සිටින බව අප සියලු දෙනාම දන්නා උතුම් සත්‍යයයි. එලෙස යේසුස්වහන්සේ කුරුසියේ මරණය දක්වා ගමන් කළේ ඇයි? උන්වහන්සේ එලෙස කීකරු වූයේ ඇයි?

**"උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නමුත් තමන් වින්ද දේවලින් කීකරු කම ඉගෙන ගත් සේක. මෙසේ උන්වහන්සේ සම්පූර්ණ කරනු ලැබ මෙල්කිසදෙක්ගේ පිළිවලේ හැටියට උත්තම පූජකයෙක්ය යන නම දෙවියන්වහන්සේගෙන් ලැබ, තමන්වහන්සේට කීකරුවෙන්නාවූ සියල්ලන්ටම සදාකාල ගැලවීමේ කතෘ වූ සේක" හෙබ්‍රෙව් 5:8-10**. ඉහත බයිබල් පදයෙහි සඳහන් "උන්වහන්සේ කීකරුකම ඉගෙන ගත් සේක; එම ගැලවීම කරණකොටගෙන සියලු දෙනා උදෙසාම ගැලවීමේ කතෘ වූ සේක" යන පද කොටස දෙස ඔබගේ අවධානය හොඳින් යොමු කරන්න. යේසුස්වහන්සේ මේ කීකරුකම ඉගෙන ගත්තේ දුක්විඳීම කරණකොට ගෙන බව ඔබට පැහැදිලි වේවි. මෙම ශුද්ධ ලියවිලි පාඨයේ යේසුස්වහන්සේ කීකරු වූ බව සඳහන් කරන අතරම උන්වහන්සේ දුක්විඳීම තුළින් කීකරුකම ඉගෙන ගත්තේ ඇයි?



**රෝම 5:19 "මක්නිසාද එක මනුෂ්‍යයාගේ අකීකරුකම කරණකොට ගෙන බොහෝදෙනා පව්කාරයන් කරනු ලැබුවා සේම, එක්කෙනාගේ කීකරුකම කරණකොටගෙන බොහෝදෙනා**

**ධර්මිෂ්ඨ කරනු ලබන්නේය"** යන ශුද්ධ ලියවිලි කොටසෙහි සඳහන් එක මනුෂ්‍යයාගේ අකීකරුකම කරණකොටගෙන බොහෝදෙනා පව්කාරයන් කරණු ලැබුවා යනු ආදම්ගේ



පාපය කරණකොටගෙන මුලු මනුෂ්‍ය සංහතියම පව්කාරයන් බවට පත්වීමයි. එසේම තව දුරටත් එක්කෙනාගේ කීකරුකම කරණකොටගෙන බොහෝ දෙනා ධර්මිෂ්ඨ කරනු ලබන්නේය යනු යේසුස්වහන්සේ කරණකොටගෙන අපට ලැබුණු ගැලවීමයි. යේසුස්වහන්සේගේ කීකරුකම කරණකොටගෙන බොහෝ දෙනා ධර්මිෂ්ඨ කරනු ලැබුවා නම් යේසුස්වහන්සේ කීකරු වුණේ කුමකටද? කාටද?

මෙම ගැලවීමේ සැලසුම මනුෂ්‍යයා පාපයට වැටීමෙන් පසුව නිර්මාණය වූ දෙයක් නොවෙයි. **එපීස 1:4 "ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තෝරාගත් ලෙසම උන්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල සියලු ආත්මික ආශිර්වාද වලින් උන්වහන්සේ අපට ආශිර්වාද කළ සේක".** මනුෂ්‍යයා මැවීමටත් පෙර සිටම දෙවියන්වහන්සේ තුල මෙම සැලසුම තිබුණා. යේසුස්වහන්සේගේ කීකරුකම ලෙස මෙහි අර්ථ දක්වන්නේ උන්වහන්සේ කුරුසිය මත කළ උතුම් පූජාවයි. දෙවියන්වහන්සේගේ ගැලවීමේ සැලසුම සම්පූර්ණ වූයේ යේසුස්වහන්සේ කුරුසියේ මරණයට පත්වූ පසුවයි. මෙම ගැලවීමේ සැලසුමට යේසුස්වහන්සේ කීකරු වූ සේක. එය කිසිවිටකත් බලකිරීමකට යටත් කළ කීකරුකමක් නොවන බව පිලිප්පි පොතේ සඳහන් වේ. එනම් යේසුස්වහන්සේ තමන්ම යටත් කර ගත් බව සහ කුරුසියේ මරණය දක්වා තමන්ම කීකරු වූ සේක.

අවසානය දක්වාම කීකරු වූ උන්වහන්සේ ගැලවීමේ කතෘන්වහන්සේ බවට පත් වූසේක. ප්‍රිය මිතුර මිතුරිය කුරුසිය මත යේසුස්වහන්සේ කළ පූජාව කරණකොටගෙන ඔබත් මමත් මුදනු ලැබූ සෙනගක්ව උන්වහන්සේ තුළ සදාකාල ජීවනය හිමිකරගෙන සිටිමු. හිමිකර ගත් ඒ උතුම් ත්‍යාගය කරණකොටගෙන උන්වහන්සේ මෙන් කීකරු සිතැත්තෝ වෙමු. ඔබට දෙවියන්වහන්සේට කීකරු වීමට ශුද්ධාත්මයාණන් වහන්සේ උපකාර කරන සේක්වා!

**- දේශනාවක් ඇසුරෙනි -**




# ප්‍රීතිමත් විවාහ ජීවිතයකට....



අද ලෝකය දෙස බලන විට අසාර්ථකවූ විවාහ ජීවිත පිළිබඳ කණගාටු දායක නටඹුන් බොහෝමයක් අප හට සුලභව දැකිය හැකිය. වෙන්වීම සහ දික්කසාදය, විවාහය වාගේ ම සුලභ සිදුවීමක් බවට පත්වී හමාරය. සෑම කුඩා ඔළුවේ කැක්කුමකටම විසඳුම දික්කසාදය වීම යයි සිතන්නට මනුෂ්‍යයෝ පෙළඹී සිටිති. මෙය බොහෝ කණගාටුදායක මෙන්ම දෙවියන්වහන්සේ ඉදිරිපිට ඉතා අප්‍රසන්නවූ දෙයකි. විවාහ ජීවිතය නියම කරනු ලැබුයේ දෙවියන්වහන්සේ විසින්මය. එය අති ශුද්ධව පවත්වා ගැනීම දෙවියන්වහන්සේ ඉදිරිපිට සෑම යුවලකගේම පරම යුතුකමයි. දෙවියන්වහන්සේව නාඳුනන අය එනම් නොඇදහිලිවන්තයන් මේ බව නොදනිති. එහෙත් උන්වහන්සේගේ දරුවන් වන අපට මේ පිළිබඳව තිබෙන වගකීම විශාලය.

ප්‍රීතිමත් විවාහ ජීවිතයක් සඳහා දිව්‍ය ප්‍රේමය අත්‍යාවශ්‍යය. මනුෂ්‍ය ප්‍රේමය ඒ සඳහා කිසිසේත් නොසෑහේ. මේ නිසා දිව්‍ය ප්‍රේමය ඔබගේ සිත් වලට ලබාදෙන මෙන් ස්වාමීන්වහන්සේගෙන් නිතර ඉල්ලා සිටිය යුතු වේ. විවාහ ජීවිතයේ දී පැමිණෙන අනේක විධි කම් කටොලු පරීක්ෂා සහ හිඟකම් යන අත්දැකීම් ජය ගැනීම සඳහා අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේගේ නැවත නැගිටීමේ බලය තම ජීවිත වලට දින පතා අගය කිරීමටත්, අත් දැකීමටත් අප ඉගෙන ගත යුතු වෙමු. ප්‍රීතිමත් විවාහ ජීවිතයකට දෙදෙනා අතර සැබෑ ප්‍රේමණීය වූත් ආත්මික වූත් සහභාගීකමක් තිබීමද අත්‍යාවශ්‍යයි. සමහර පවුල්වල භාර්‍යාව පුරුෂයාට කථාකරන්නේ මුදල් අවශ්‍යවූ විට පමණි. පුරුෂයාද, තම ඇඳුම් සෝදාගැනීමට පමණක් තම භාර්යාවට කථා කරයි. සමහරවිට දෙදෙනා තරහා වී සියලු පණිවිඩ හුවමාරු කිරීමේ මාධ්‍යය ලෙස දරුවන් පාවිච්චි කරති. මෙය ඉතා භයානක සහ කණගාටුදායක තත්වයකි. විවාහය තරම් මිහිරි වූ ප්‍රීතිමත් සම්බන්ධතාවයක් මිහිපිට තවත් නැත. එහෙත් ඒ සඳහා අප නියම ආත්මික ප්‍රතිපත්ති අනුගමනය කිරීමට වග බලා ගතයුතු වෙමු.

# තුන්පට ලණුව


**"යමෙක් තනි කෙනෙකු පරාද වන නුමුත් ඔහුට විරුද්ධව සිටින්ට දෙන්නෙකුට පුළුවන් වෙයි. තුන්පට ලණුවක් ඉක්මනින් නොකැඩෙන්නේය"(දේශනාකාරයා 4:12).**

ප්‍රීතිමත් විවාහ ජීවිතයක් අත් දැකීමට නම්, විවාහ වන යුවල තුන් ප්‍රකාර අන්‍යෝන්‍යය සම්බන්ධතාවයකට පැමිණිය යුතුය. එය ආත්මය, ප්‍රාණය සහ ශරීරය යන තුන් ආකාර සම්බන්ධතාවයයි. ඉහත දේව වචනයේ සඳහන් වන තුන්පට ලණුව නම් මෙයයි. **1 තෙසලෝනික 5:23** ට අනුව මනුෂ්‍යයා ත්‍රිත්වයකි. **"සමාදානයේ දෙවියන්වහන්සේම නුඹලා සහමුලින්ම පවිත්‍රකරන සේක්වා, නුඹලාගේ මුලු ආත්මයත් ප්‍රාණයත්, ශරීරයත් අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඊමේදී නිදොස්ව තිබෙන ලෙස ආරක්ෂා කරනු ලැබේවා". උත්පත්ති 2:7** හි මෙසේ සඳහන් වේ. ස්වාමීවූ දෙවියන්වහන්සේ භූමියේ දූවිල්ලෙන් මනුෂ්‍යයා සාදා ඔහුගේ නාස්පුඩුවලට ජීවනයේ හුස්ම හෙළූසේක. එවිට මනුෂ්‍යයා ජීවමාන ප්‍රාණයක් විය.

දැන් අපි මදකට ශරීරය, ආත්මය සහ ප්‍රාණයේ සංයුතිය ගැන සලකා බලමු. ශරීරය නම් ඇට, මස් සහ ලේ එකතුවකි. ප්‍රාණයට අයිති කොටස්නම් දැනගැන්ම නොහොත් සිතීමේ හැකියාව, හැඟීම් (ප්‍රේමය, කණගාටුව වැනි) සහ තම කැමැත්ත වේ. "පුළුවනි" හෝ "බැහැ" යයි තමාට තීරණ ගැනීම පිණිස දෙවියන්වහන්සේ සෑම මනුෂ්‍යයෙකුටම තම කැමැත්තක් දී තිබේ. අපේ ආත්මයටද කොටස් තුනක් තිබේ. පළමු එක නම් හෘද සාක්ෂිය නොහොත් අප පාපයක් කරන්නට යන විට ඒ පිළිබඳව අපට වරද අඟවා දෙන අප තුළ කථාකරන හඬයි. "ප්‍රවේසම්වන්න, බොරුවක් කියන්න එපා" යයි හෘද සාක්ෂිය පවසයි. එහෙත් හෘද සාක්ෂියට නිශ්ශබ්ද වීමට අණකර අපි ගොස් බොරුකීමට පෙළඹෙමු. ආත්මයේ දෙවෙනි කොටස නම් දෙවියන්වහන්සේට නමස්කාර කිරීමටත් උන්වහන්සේව දැක ගැනීමටත් තිබෙන හැකියාවයි. සත්වයෙකුට ප්‍රාණයක් මිස ආත්මයක් නැති බැවින් දෙවියන්වහන්සේට නමස්කාර කිරීමේ අපූර්ව හැකියාව ඇත්තේ මනුෂ්‍යයාට පමණි. ආත්මය සමන්විත වන තුන්වෙනි කොටස ගැන හරි පැහැදිලි කිරීමක් කළ නොහැකිය. අපට හදිසියේ යම් දෙයක් කළ යුතු බව හැඟීයන්නේ සහ යමක් සිදුවන්නට පෙර යම් අනතුරු ඇඟවීමක් මෙන් සිතට දැනෙන්නේ ආත්මයේ මේ කොටස තුළින් යයි විශ්වාස කෙරේ.

ඉහත සඳහන් තුන් ප්‍රකාර (ආත්ම, ප්‍රාණ සහ ශරීර) ඒකත්වය යන දිව්‍ය ප්‍රතිපත්තිය අනුගමනය කරන අයට ප්‍රීතිමත් සහ සඵලවත් විවාහ ජීවිතයක් ගත කළ හැකිය. ඔව්හු පළමුව ආශා කළ යුත්තේ ආත්මික ඒකත්වයයි. මේ සඳහා ඔව්හු දිනපතා

දවස ආරම්භයේදී ද අවසානයේදී ද එකට දෙවියන්වහන්සේගේ වචනය සමඟ උන්වහන්සේගේ ඉදිරිපිට දණින් සිටිමින් දෙවියන්වහන්සේ සමඟ වේලාවක් ගතකළ යුතුය. සෑම කාරණයක් පිළිබඳවම ඔවුහු එකට දෙවියන්වහන්සේගේ කැමැත්ත සෙවිය යුතුය, එකට නමස්කාර කළ යුතුය, හැකි




තරම් දුරට එකට දෙවියන්වහන්සේගේ ගෘහයට යා යුතුය. "මට බොහෝම වැඩ තිබෙනවා ඒ නිසා බිරිඳ, ළමයින් සමඟ යාච්ඥා කරපුදෙන්" යයි සමහර පුරුෂයෝ කියා සිටිති. එහෙත් එකට යාච්ඥා කිරීම යුවලකට අත්‍යාවශ්‍යම දෙයකි. "අපි දෙදෙනා එකිනෙකාට වඩා බොහොම වෙනස්, ඒත් අපි හොඳට සමාදානෙන් ඉන්නවා" යයි සමහරු පවසති. සමාදානයෙන් සිටීම හොඳ දෙයකි. ඒත් එකිනෙකාට වෙනස්ව සිටීම නම් කොහොමවත් විවාහ ජීවිතයට හිතකර වන්නේ නැත. විවාහක යුවලකට හැකිතරම් දුරට තිබිය යුත්තේ දෙදෙනාටම පොදුවූ අදහස්, පොදු වූ මිත්‍රයන්, පොදු වූ ආශාවන් සහ පොදු වූ රහස්ය. තවද ඔවුන්ගේ ශාරීරික සම්බන්ධතාවය ඉතා ශුද්ධව පවත්වා ගත යුතුමය. අන්‍යෝන්‍ය ශරීරය සහ එහි අවශ්‍යතා ගැන ඔවුන් මනාව කල්පනාකාරී විය යුතුය. දෙවියන්වහන්සේ ඔවුන්ව එකතුකර තිබෙන්නේ දේව භක්තිමය වංශයක් ගොඩනැගීමට බව ඔවුන් මතක තබාගෙන ඒ ආකාරවූ දරුවන් ලබා දෙන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටිය යුතුය.

අප විසින් ඉහත දී සාකච්ඡාකළ සරල දිව්‍ය ප්‍රතිපත්ති අනුගමනය කිරීම මගින් ලෝකයේ ඕනෑම පළාතක වාසය කරන විවාහක යුවලකට ප්‍රීතිමත් විවාහ ජීවිතයක් ගත කළ හැකිය. අපගේ යාච්ඥාව නම් දෙවියන්වහන්සේ විසි න් එකතු කරනු ලබන අයගේ සිත් වල මෙම දිව්‍ය ප්‍රතිපත්ති අනුග මනය කළොත් ඔවුන්ගේ නිවස ප්‍රීතිමත් නිවසක් වනු ඇත. එය ආශිර්වාදලත් නිවසකි, ප්‍රේමයේ නිවසකි, සමාදානයේ නිවසකි, සේවයේ නිවසකි, ඇදහිල්ලේ නිවසකි, සහභාගීකමේ නිවසකි, දෙවියන්වහන්සේට ගෞරවය ගෙනෙන නිවසකි. එවැනි නිවසක් මිහිපිට ස්වර්ග යකි.

**- ගුරු හරු -**

# යක්ෂයාගේ විකල්ප

## (3 වෙනි කොටස)

**නුඹලා නුඹලාගේ පියවූ යක්ෂයාගෙන්ය, නුඹලා නුඹලාගේ පියාගේ තෘෂ්ණාවන් ඉෂ්ටකරන්ට කැමතිය. ඔහු පටන්ගැන්මේ සිට මිනීමරන්නෙක්ය, ඔහු තුළ සැබෑකම නැති හෙයින් ඔහු සැබෑවෙහි නොපැවතුණේය. ඔහු බොරුවක් කියන කළ තමාගේම දේ කියයි. මක්නිසාද ඔහු බොරුකාරයෙක්ය, බොරුවේ පියාය. (යොහාන් 8 :44)**

දෙවියන්වහන්සේගේ සියලු අභිප්‍රායන්ට විරුද්ධව සිටින යක්ෂයා මිනිස් ඉතිහාසය පුරා දෙවියන්වහන්සේ සපයා දෙන සැලසුම වෙනුවට විකල්ප සැලසුම් ලබා දෙමින් සිටි. ඒවා යක්ෂයාගේ " අනේකවිද මුලාවන්" ලෙසද හැඳින්විය හැකිය. ඔහු බොරුවේ පියා නිසා ස්වභාවිකවම බොරු කියයි. සත්‍ය මෙන් පෙනෙන්නට සාර්ථකවම බොරු කියන්ට දන්නේ ඔහුය. වර්තමාන ලෝකයේ ජීවත්වන මිනිස් සංහතියේ වැඩිම ප්‍රතිශතයක් ඔහු ඉතිරිපත් කල විකල්ප බොරු විශ්වාස කරගෙන සිටියි.

මීට සඟරා වාර කිහිපයකට පෙර මෙම ඉහත මාතෘකාව සාකච්ඡා කිරීම අප විසින් ආරම්භ කළ බව ඔබට මතක් කර දීමට කැමැත්තෙමි. වර්තමානයේ ඉතාමත් ජනප්‍රිය යක්ෂයාගේ එවන් විකල්ප අදහස් හෙවත් වැඩිම දෙනෙක් විශ්වාස කරගෙන සිටින අනේකවිද මුලාවන් අපි ලැයිස්තු ගත කෙළෙමු. එය ඔබගේ මතකය අලුත් කරන පිණිස පහතින් සඳහන් කරමු.

1. අදේවවාදය (මරණයේ දර්ශනවාදය)
   බයිබලීය පිළිතුර : **ගීතාවලිය 14:1**

2. පරිණාමවාදය (සියල්ලෝම අදහන බොරුව)
   බයිබලීය පිළිතුර : **උත්පත්ති 1**

3. ජ්‍යෝතිෂ්‍යය (මිථ්‍යාවේ අන්ධකාරය)
   බයිබලීය පිළිතුර : **ගීතාවලිය 19:1**

4. ආගමික මතවාද (මිනිසාගේ මාර්ගය)
   බයිබලීය පිළිතුර : **හිතෝපදේශ 14:12**

5. සාවද්‍ය සුභාරංචිය (කිතුණු දහම තුළ වියවුල)
   බයිබලීය පිළිතුර : **ගලාති 1:6-7**

6. සාවද්‍ය ඇදහිලි ක්‍රම (මුලාව යන තාරකාවෝ)
   බයිබලීය පිළිතුර : **යූද් 3 හා 4**

7. පිටසක්වල ජීවීන් (මහා මුලාව)
   බයිබලීය පිළිතුර :
   **2 තෙසලෝනික 2:11,12**

ඉහත සඳහන් මුලාවන් හතෙන් අංක එක සහ දෙක කෙටියෙන් සාකච්ඡා කොට හමාරය.

## 3. ජ්‍යෝතිෂ්‍යය (මිථ්‍යාවේ අන්ධකාරය)

ජ්‍යෝතිෂ්‍යය ශාස්ත්‍රය, ආකාශ වස්තූන් ගේ පිහිටීම පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයක් වන තාරකා විද්‍යාව සමග පටලවා නොගත යුතුය. මූලික තාරකා විද්‍යා දැනුම මිත්‍යා විශ්වාස ගොන්නක් සමග මිශ්‍ර කොට ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රය සකසාගෙන තිබේ.

ජ්‍යෝතිෂ්‍යය ශාස්ත්‍රය යනු, ආකාශ වස්තූන්ගේ චලනය සහ පිහිටීම්, මානව කටයුතු පිළිබඳ අනාවැකි සපයන්නේයයි විශ්වාස කිරීමයි. මෙසේ මානව කටයුතු සහ හැසිරීම් පිළිබඳ අනාවැකි කීම සඳහා ආකාශ වස්තූන්ගේ (ග්‍රහලෝකවල) පිහිටීම සලකා බැලීම ජ්‍යෝතිෂ්‍යය නමැති ව්‍යාජ විද්‍යාවයි.
ග්‍රහ තාරකාවලට සහ ඒවායේ පිහිටීමට මිනිස් කටයුතු පාලනය කිරීමට හෝ ඒ ගැන පේන කීමට හැකි බව ඔප්පු කිරීමට කිසි සාක්ෂියක් ඇත්තේ නැත. ග්‍රහ තාරකාවල එක එක පිහිටීම මිනිසාට මෙසේ බලපාන්නේ යැයි පුරාණ මිනිසුන් කළ විශ්වාසයක ප්‍රතිඵලය වර්තමාන ජ්‍යෝතිෂ්‍යය ශාස්ත්‍රයයි. ලොව පුරා මිලියන ගණනක් ජනයා මෙම ව්‍යාජ විද්‍යාව විශ්වාස කරති. ජ්‍යෝතිෂ්‍යය අඳුරු මිත්‍යා විශ්වාසයන් කරා අප ගෙන යයි. එයට කිසි අයුරකින් සම්බන්ධ නොවන්න. එය දෙවියන්වහන්සේගේ දරුවන් විසින් දොස්තැබිය යුතු අඳුරු විශ්වාසයක්ය. මිහි පිට මිනිසෙකු මිය ගිය විට, ඔහු ඈත අභ්‍යවකාශයේ තාරකා මන්දාකිණියක එක් තාරකාවක් බවට පත්වන්නේ යැයි අමූලික බොරු උගන්වන්නේ මෙම ජ්‍යෝතිෂ්‍යයයි.

## විශ්මිත විශ්වය

අප ජීවත්වන්නේ කියන්ට බැරිතරම් ලස්සන විශ්වයකයි. එහි එක තැනක ඇති ක්ෂීර පථය නමැති මන්දාකිණියේ පිහිටි කුඩා සෞරග්‍රහ මණ්ඩලයක අප ජීවත්වන පෘතුවිය නමැති ග්‍රහලෝකය පිහිටා තිබේ. එවැනි සෞරග්‍රහ මණ්ඩල මිලියන ගණනක් ක්ෂීර පථය තුළ පිහිටා තිබේ. ක්ෂීර පථය වැනි තවත් මන්දාකිණි කෝටි ගණන් තිබෙන බව තාරකා විද්‍යාඥයෝ දැන් අපට පවසති. බලන්න මේ විශ්වය කෙතරම් විශාලද! කෙතරම් විශ්මිතද!

මෙවන් අභ්‍යවකාශ වස්තූන් පිළිබඳ දුර මනිනු ලබන්නේ ආලෝක වර්ෂ නමැති ඒකකයකින් මිස සැතපුම්වලින් නොවේ. සැතපුම්වලින් කීවොත් කියාග න්නට නොහැකි තරම් විශාල ගණන් අපට හමුවේ. අපගේ සූර්යාට ලඟින්ම තිබෙන මීළඟ සූර්යා හඳුන්වනු ලබන්නේ ප්‍රොක්සිමා සෙන්චෝරි (Proxima Centauri) නමින්ය. එය පෘතුවියේ සිට ආලෝක වර්ෂ 4.2 දුරින් පිහිටා ඇත. එම දුර ප්‍රමාණය කොපමණදැයි අපට තේරෙන අයුරින් කියතොත් පහත ඇති ලෙස සඳහන් කල හැක. තත්පරයකට සැතපුම් 186,000 ක වේගයෙන් එක දිගට නොනවත්වා අවුරුදු 4.2 ක් ගමන්කරන්නට හැකි වුවහොත් කෙනෙකුට ගමන් කළ හැකි වන දුර ප්‍රමාණය ඉන් අදහස් කෙරේ. මේ තමා පෘථිවියට ලඟින්ම ඇති තාරකාවට තිබෙන දුර! තව ඊට වඩා ඈතින්

තිබෙන ප්‍රකෝටි ගණන් ආකාශ වස්තු පිළිබඳ කවර කතාද? පවතින මේ සා ප්‍රමාණ දුර නිසාම ඒවා ගැන අධ්‍යනය කිරීම එපමණම අපහසුව තිබේ. මේ හේතුවෙන් එවැනි ග්‍රහ වස්තු පිළිබඳ අද්භූත අදහස් සිතින් මවාගෙන ඒවා සමාජ ගත කිරීමට පැරැන්නන් පෙළඹීම පුදුමයට කරුණක් නොවේ.

විශ්වයේ පවතින ආකාශ වස්තූන් වලින් දෙවියන්වහන්සේ අදහස් කල ප්‍රධාන අරමුණු දෙකක් බයිබලයෙහි පෙන්වා දෙයි.

පලමුවැන්න **ගීතාවලිය 19:1** හි සඳහන් වේ. **"අහස දෙවියන්වහන්සේගේ මහිමය ප්‍රකාශකරයි. ගුවන්තලය උන්වහන්සේගේ හස්තකර්මාන්තය දක්වයි."**

ඔව්, අප අවට ඇති මේ මහා විශ්වයේ අදහස නම් එමගින් අපට දෙවියන්වහන්සේගේ බලය සහ මහන්තත්වය කියා පෑමයි. එහෙත් බලන්න මනුෂ්‍යාට සිදුවී තිබෙන අවාසනාවන්ත වියවුල! විශ්වය තුලින් දෙවියන්වහන්සෙගේ මහන්තත්වය දකිනු වෙනුවට මිනිසා එම විශ්වය තමාට පේන කියන මෙවලමක් කරගන්නට උත්සහ දරමින් සිටියි. කවුද මෙවැනි අඥාන දේ කරන්නට මිනිසා පොළඹවන්නේ? පිළිතුර අපගේ මාතෘකාවේ තිබේ.

විශ්වයේ දෙවැනි අරමුණ **උත්පත්ති 1:14-18** කොටසෙහි මනාවට විස්තර කෙරෙයි. **"රාත්‍රියෙන් දවාල වෙන් කිරීමට අහස්තලයෙහි ආලෝකයෝ වෙත්වා, ඒවා ලකුණු පිණිසද සෘතු පිණිසද දවස් පිණිසද අවුරුදු පිණිසද වෙත්වා, පොළොවට එළිය දීමට ඒවා අහස්තලයෙහි ආලෝකයන් පිණිස වෙත්වා" (14,15).**

ඔව් සැබැවින් මිනිසා ඉර හඳ තාරකා මගින් දින වකවානු නිර්ණය කර ගැනීම උගෙන තිබේ. තම ගමන් මග දිසාව නිර්ණය කර ගැනීමට ආකාශ වස්තු වල පිහිටීම උපයෝගී කරගන්නටත් උගෙන තිබේ. එහෙත් බලන්න මිනිස් සිතේ අන්ධකාරයක මහත! දෙවියන්වහන්සේ අදහස් කල දෙයින් නොනැවතුනු මිනිසා තමාගේ අනාගතය ගැන පේන කියන්නටත් ආකාශ වස්තුවලට අඬගසයි. තම සිත්වල නිශ්ඵල අන්ධකාරයට අනුව යමින් ග්‍රහ පලා-ඵල යනුවෙන් විෂයක්ද නිර්මාණ කරගෙන තිබේ. මෙවැනි නිශ්ඵල දේ කරන්නට ඔහු පෙළඹුවේ කවුරුන්ද? පිළිතුර ඉහත මාතෘකාවේ අන්තර්ගතයි.

ජ්‍යෝතිශ්‍ය ශාස්තරය හැදෑරීමට හෝ අනුගමනය කිරීමට ඔබගේ වටිනා කාලය වැය නොකරන්න. එය යක්ෂයා විසින් සකසා මිනිසාගේ පාපකාරී සිතට ඇතුලත් කරන ලද මහා මුලාවකි. ඔබගේ ජීවිතයේ තීරකයා ආකාශ වස්තු නොව ඒවා මැවූ දෙවියන්වහන්සේ බව තරයේ මතක තබාගන්න.

යක්ෂයාගේ විකල්ප මාර්ග පිළිබඳ අධ්‍යනය පසුව ඉදිරියට කිරීමේ අරමුණින් අදට නිම කරමු.

**- නෙවිල් ජයසුන්දර -**

# ජ්වලිත සීමොන් මෙන්න

ජ්වලිතයා යන නම දරණ මෙම ප්‍රේරිතයා සැබවින්ම සැමවිටම ඉතා උද්‍යෝගිමත් ප්‍රේරිතයෙකි. සියල්ලෙහිදී ඔහු යේසුස්වහන්සේට යටත්ය. උන්වහන්සේගේ කැමැත්ත කිරීමෙන් ඔහු සතුටු විය. එපමණක් නොවේ. "සමහරකු මෙන් ඕනෑම නිසා කරන" පුද්ගලයෙකු වීමට ඔහු අසතුටු වෙයි. ජ්වලිතකමින් ඉතා උද්‍යෝගිමත්ව කරන දේ ඕනෑ කමින් කිරීමට සිමොන් මැලිනොවෙයි. කැපි පෙනීමට, උස්තැන්වල වාඩිවීමට ඔහු තුළ කැමැත්තක් නැත. ගෞරවණීය හෝ දේවධර්මාචාර්ය වැනි තනතුරක ආශ්වාදයක් විඳිනවාට වඩා මේ මනුෂ්‍යයා තිරයෙන් පිටුපස අප්‍රසිද්ධව හොඳ වැඩ කරන්නට ප්‍රියමනාපයක් දක්වයි. ඔහුගේ බලාපොරොත්තුව තමා අඩු වෙන්නටත් යේසුස්වහන්සේ වැඩියෙන් දැක්වීමටත් බැව් සක්සුදක් සේ පැහැදිලිය.

## කානානිය සීමොන්

ඔහු කානාන් ගමෙහි පුරවැසියෙකි. එහෙයින් අරාමික භාෂාව ඔහුගේ මව්බස වන්නට ඇතැයි මම සිතමි. ඇතැම් බයිබල් විශාරදයන්ගේ මතයක් නම් සීමොන් යේසුස්වහන්සේව අදහාගෙන එතුමන් අනුගාමික වූයේ කානානියෙහි සරණ මංගල්‍ය දින සිදු වූ වතුර මිදිපැන් කිරීමේ හාස්කම දෑසින් දැකීමෙන් පසු බවය. මේ කරුණු බයිබලීය සහතිකයක් නොදරතත් හාස්කමක් දැකීමෙන් හෝ ඊට සම්බන්ධ වීමෙන් සිමොන් යේසුස් වහන්සේ අදහාගෙන , උන්වහන්සේගේ අනුගාමිකයෙක් වූයේ නම් එයම අපට බලවත් ආදර්ශයක් වනු ඇත. වත්මන් ක්‍රිස්තියානීන් තුළ ඇති බොහෝ දුබල තත්වයක් නම් "පුදුම හා හාස්කම්" බලමින් සතුටු වීමට වෙර දැරීමයි. එය පාපයක් නොවේ. එසේම දෙවියන් වහන්සේ තමන් පුත්‍රයාණන් තුළ ගෞරවය ලබමින් අදද බොහෝ දිව්‍ය පුදුම හා හාස්කකම් අප අතරෙහි කරන සේක. එය සත්‍යයෙන් සත්‍යයකි. එසේ වෙතත් ඇදහිල්ල පාපකමාව ගැළවීම ආදීයට මුළාවන්නේ පුදුම හෝ හාස්කම් නොවේ. ඇතැම්හු විවිධ ප්‍රසිද්ධ ආගමික මෙහෙයයන් බැලීමට යාම ආත්මික විනෝද්‍රංශයක් කරගෙන සිටිති. ඔවුන් කොරුන් ඇවිදිනු දකින්ට. අන්ධයන් පෙණීම ලබනු දකින්නට ආශා වෙති. එය යහපත් වෙති. එහෙත් ප්‍රශ්නය වන්නේ මෙවා දැකිමෙන් තව තවත් ආත්මය තෘප්තිමත් කර වීමට ඔවුන් හාස්කම් දෙසම "ඇදහිල්ල" තැබීමය. ඇදහිල්ල යනු නිතරම හාස්කම් දැකීම නොවේ. එයට වැඩි දෙයකි. හාස්කම් පසුපස ගියවුන් බොහෝ විට ඇදහිල්ල මදව සෝදිසි කරමින්ම මරණයට ළංවෙමින් සිටිති. දේව කැමැත්ත නම් තමා දකින පුදුම හා හාස්කම් තුළින් පවා දේව මහිමය අවබෝධ කරගනිමින් සිමොන් මෙන් යේසුස් ක්‍රිස්තස්වහන්සේ

අනුගමනය කිරීමය **"නුඹලා ලකුණුද පුදුමද නුදුටුවොත් විශ්වාස කරන්නේ නැත (යොහන් 4:48). නොදැක මා විශ්වාස කරන්නෝ ආශිර්වාද ලද්දෝය" (යොහාන් 20:29)** මේ වදන් යේසුස්වහන්සේගේ ම හඬිනි. ඊට සවන් දෙමු . සීමොන් අවංකව එතුමන් අනුගමනය කරයි ඔහු උන්වහන්සේ පසුපසම යමින් සත්‍යතාවය වටහා ගනී. එහිම උද්‍යොගිමත්ව ස්ථිර වෙයි. ඒ තුළින් බොහෝ හාස්කම් දෑසින් දකී. දෑතින් කරයි. **(මතෙව් 10: 1 හා 10:4 බලන්න)** එසේ වුවද ඔහුගේ කුරුමාණම හාස්කම්, සුවය හෝ පුදුම කිරීම නොවේ. දිව්‍ය සුවය හා හාස්කම් අද ද සිදු වේ.

## උදේ‍යා්ගිමත් මිනිසා

කානානීය සීමොන් මෙන් කරන දේ අවංකවද , උනන්දුවෙන්ද කිරීමට අපි තරයේ අදිටන් කර ගනිමු. **"නුඹලා මනුෂ්‍යයන් සතුටු කිරීමට මෙන් පෙනීමට වැඩ නොකොට ක්‍රිස්තුස් වහන්සේගේ දසයන් මෙන් සිතින් දෙවියන් වහන්සේගේ කැමැත්ත කර පල්ලා" (එපීස 6:6).** සීමොන් පිළිබඳව අපට මුලින්ම **මතෙව් 10:4** කියවීමට පිළිවන. **මාර්ක් 3:18** යළිත් ඔහු හමු වෙයි. **ලූක් 6:16** හිද ඔහු ප්‍රේරිත ලැයිස්තුවේ සිටී. **ක්‍රියා 1:13** අප දකින්නේ ඔහු එක්සිත්ව, උඩුමහලේ මැදුරේ 119 දෙනකු සමඟ සිටි බවය. යුදස් ස්කාරියොත් හැර අනික් සියළුම ප්‍රේරිතයන්ද සමග ඔහු එකසිත දරයි. "එකට කෑවත් බොක්ක වෙනස්" යන සිංහල ප්‍රස්ථා පිරුළ ඔවුන් එකොළොස් දෙනා බොරු කරති. ඒ නිසාම එක්සිත්ව යාච්ඤා කරති. "මම එකට හිටියට ඔය යාච්ඤාවලදී එක්සිත් වන්න මට බැහැ. මම ආමෙන් කියන්නේ නෑ" - යනු වෙන් සිතන, කියන, සිත් ඔවුන්ට හෝ සිමොන්ට තිබුනේ නැත. ඔවුන් නායකත්වයට පොර බැදුවේ නැත. කුමන්ත්‍රනය කළේ නැත. පසුව අමනාපව දොස් තබමින් ඇවිද්දේ අහක්ව ගියේ නැත. **(යොහාන් 2:18-19 බලන්න)** මේ නිසාම ශුද්ධාත්ම ආලේපය සීමොන්ද ලබයි. ශුද්ධාත්ම බලය ඔහු තුලින් ක්‍රියාත්මක වෙයි. එබැවින් ශුද්ධාත්මයක් නැතැයි කීමට ඔහුට සිදු නොවේ. ශුද්ධාත්ම දීමනා මුළාවකැයි ඔහු පවසන්නේ නැත.

## තවත් සීමොන්ලා

මෙම ලිපිය අවසන් කරමින් සිහිපත් කළ යුතු තවත් වැදගත් කරුණක් වෙයි. එනම් පේතෘස්ගේ මුල් නම සීමොන් බවය. එසේම තවත් සීමොන්ලා කිහිපදෙනෙකු අළුත් ගිවිසුමේ සිටිති. යේසුස්වහන්සේගේ සහෝදර වු සීමොන් **(මාක් 6:3) මතෙව් 13:55 )** - පරිසියෙක් වු සීමොන් **(ලූක් 7:36 - මතෙව් 26:6 මාර්ක් 14:3)** කුරුසිය ඉසිලූ කිරේනිය සීමොන් - **(මතෙව් : 27:32, මාර්ක් 15:21, ලූක් 23:26)** සම්කරුවෙකු වු සීමොන් **(ක්‍රියා 8:18)** මයාකාර සීමොන් - **(ක්‍රියා 8:9 හා ක්‍රියා 8:18)** ඔවුන්ගෙන් සමහරෙකි.

**- ප්‍රන්සිස් විජයසිංහ -**

# දෙවියන්වහන්සේ සමඟ මිත්‍රත්වය

හොඳ මිතුරෙක් හෝ මිතුරියක් තුළ බලාපොරොත්තු විය හැකි ගුණාංග අතර අවංකකම හෙවත් සත්‍යවාදිකම, විශ්වාසය, දුක සැප බෙදාගැනීම, රහස් ආරක්ෂාකිරීම, සවන්දීම සහ අන්නෝන්‍යය අවබෝධය වැනි ඒවා අනිවාර්යයෙන්ම තිබිය යුතුය.

එවිට එය පලුදු නොවන සැමදා පවතින ශක්තිමත් මිත්‍රත්වයක් වනු ඇත. ඔබටත් එවැනි මිතුරෙකු සිටිනවා විය හැක. ඇතැමෙකුට එම මිතුරා පාසැලේ හෝ කාර්යාලයේ හෝ අසල්වාසි හෝ කෙනෙකු විය හැක. තවත් අයට තමාගේ ම සහෝදරයා, සහෝදරිය, මව, පියා, ස්වාමිපුරුෂයා, භාර්යාව විය හැක. කෙසේ වෙතත් එවැනි මිතුරෙක් සිටීම හොඳය.

අහස පොළොව මැවූ සර්වබලධාරි දෙවියන්වහන්සේටත් මේ පොළොව මත ජීවත් වන මිනිසුන් අතරෙන් මිතුරෙකු සිටි බව ශුද්ධ බයිබලයේ සඳහන් වේ. ඒ අන් කෙනෙක් නොව අප හොඳින් දන්නා ආබ්‍රහම්ය.

**යෙසායා 41:9** හි ආබ්‍රහම් මාගේ මිත්‍රයා යයි දෙවියන්වහන්සේ ප්‍රකාශ කළසේක. **2 ලේකම් 20:5** හි 'ඔබගේ මිත්‍රවූ ආබ්‍රහම්' යයි යෙහෝෂාපාට් රජ දෙවියන්වහන්සේට ප්‍රකාශ කරන්නේය. අලුත් ගිවිසුමේ **යාකොබ් 2:23** හි ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ මිතුරා යයි කියනු ලැබූ බව සඳහන්ය. මෙලෙස තුන් වතාවක්ම ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ මිතුරා ලෙස නැවත නැවත සඳහන් වීම විශේෂත්වයකි. මෙම විශේෂත්වයට තුඩු දෙන කරුණු සලකා බැලීම ඇදහිලිවතුන් වන අපට වැදගත් වේ. දෙවියන්වහන්සේගේ මිත්‍රයාවන පිණිස ආබ්‍රහම් තුළ දැකිය හැකි හොඳ ගුණාංග අතුරින් කැපී පෙනෙන ප්‍රධාන ගුණාංග දෙක නම් සෑම අවස්ථාවකදීම දෙවියන්වහන්සේව විශ්වාස කිරීම හා උන්වහන්සේට කීකරු වීමට සුදානම්ව සිටීමයි. ඔහු එසේ කරමින් තමාට පසු තම දරුවන්ටත් තම ගෙයි වැසියන්ටත් එසේ කරන්නට අණකරන කෙනෙක් ලෙසට දෙවියන්වහන්සේ ඔහුව හඳුනාගෙන සිටි බව **උත්පත්ති 18:19** හි ලියා තිබේ.

## විශ්වාසය සහ කීකරුකම

**ක්‍රියා 7:1** අනුව මහිමාන්විත දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට ප්‍රකාශ වූසේක. ඊට පෙර ඔහු සේවය කළේ දේවතාරූපවලට බව **යොෂුවා 24:3** හි සඳහන්ය. දෙවියන්වහන්සේ කෙරෙහි ඔහු විශ්වාස කරන පිණිස කිසිම ප්‍රාතිහාර්යයක් හෝ පුදුම ලකුණු ඔහු ඉදිරිපිට උන්වහන්සේ දැක්වූයේ නැත. එනමුත් මහිමාන්විත දෙවියන්වහන්සේ ඔහුට පෙනී කථාකිරීමෙන් පසු ඔහුගේ ජීවිතය මහත් විපර්යාසයකට භාජනය විය. වසර ගණනාවක් රූප පිළිමවලට නමස්කාර කරමින් සේවය කළද කිසි දිනෙක එම නිෂ්ඵලවූ දේවල් වලින් කිසිදු ප්‍රතිචාරයක් නොලැබීම ඊට

ප්‍රධාන හේතුව විය හැක. ඇස් තිබුනත් පෙනෙන්නේ නැති, කන් තිබුනත් ඇසෙන්නෙත් නැති රූප පිළිමවලට නමස්කාර කිරීමේ නිශ්ඵලභාවය ඔහුට හොඳට අවබෝධ වන්නට ඇත . එම නිසා තමන්ට ජීවමාන ලෙස කථාකරන මහිමාන්විත දෙවියන්වහන්සේ අනුග මනය කිරීමට ඔහු තීරණය කළේය. උන්වහන්සේ ඔහුට ප්‍රකාශ වී ඔහු සිටින දේශයෙන් ඉවත්ව උන්වහන්සේ පෙන්වන දේශයට යන්නැයි කියූ විට, **හෙබ්‍රෙව් 11:8** පදයට අනුව තමා කොතැනට යනවාදැයි නොදැන උන්වහන්සේ විශ්වාස කර කීකරුව පිටත් විය. මෙය කෙතරම් අපූරු විශ්වාසයක්ද කීකරුකමක්ද!

## දෙවියන්වහන්සේගේ පොරොන්දු හා අන්නෝන්‍යය සබඳතාවය

**උත්පත්ති 12:1-3** පදවලට අනුව දෙවියන්වහන්සේ ඔහුව කැඳවූ අවස්ථාවේදී ඔහුට සිතා ගන්නවත් බැරි තරම් මහත් පොරොන්දු දුන් සේක. ඔහුද දෙවියන්වහන්සේ විශ්වාස කළේය. ආබ්‍රහම්ට දරුවෙක් නැතිව සිටි අවස්ථාවේදී ඔහු තුලින්ම නික්මෙන කෙනෙක් ඔහුගේ උරුමක්කාරයා වන්නේයැයි උන්වහන්සේ කීවිට ඔහු එය විශ්වාස කළේය **(උත්පත්ති15:4-6)**. මෙම පොරොන්දු ඉටු වීමට වසර ගණනාවක් ගත වුවද අවසානයේදී දෙවියන්වහන්සේ ඔහුට පුත්‍රයෙක් දුන් සේක



උන්වහන්සේව විශ්වාස කළාවූ ඔහුගේ කීකරුකම තවදුරටත් සෝදිසි විය. එනම් ඔහු බලාපොරොත්තු නොවූ අවස්ථාවකදී දෙවියන්වහන්සේ තවත් අභියෝගාත්මක ක්‍රියාවක් කිරීමට කීසේක. එනම් ඔහුගේ එකම පුත්‍රයා දවන පූජාවක්කොට ඔප්පු කිරීමටයි. එම අවස්ථාවේදීද සුපුරුදු ලෙස ප්‍රතිචාර දක්වමින් ප්‍රශ්ණ කිරීමෙන් තොරව නිශ්ශබ්දව කීකරු විය. ඔහු ඇදහිල්ලෙන් ඔහුගේ පුත් ඊසාක්ව පූජා කරමින් සිටි බව **හෙබ්‍රෙව් 11:18** පදයේ සඳහන්ය. මෙලෙස ආබ්‍රහම්ව දෙවියන්වහන්සේ අවසාන මොහොත දක්වාම පරීක්ෂා කළ විට ඔහුගේ කීකරුකම ස්ථිර ලෙස පෙන්වීමෙන්, ඔහු උන්වහන්සේට විශ්වාසය තැබිය හැකි මිත්‍රයෙක් බව ඔප්පු කළේය. උත්පත්ති 12වන පරිච්ඡේදයේ දෙවියන්වහන්සේ දුන් පොරොන්දුව, එනම් ආබ්‍රහම්ට වංශයක් සදා දෙන බවත් එම වංශයට උන්වහන්සේ පෙන්වන දේශය උරුමකර දෙන බවත් සත් වතාවක්ම නැවත නැවත ස්ථිර කළ සේක. කරුණාකර මෙම පද උත්පත්ති පොතෙන් කියවා බලන්න.

**උත්පත්ති 12:1-3**
**උත්පත්ති 12:7**
**උත්පත්ති 13:14-17**
**උත්පත්ති 15:5-7**
**උත්පත්ති 15:18-21**
**උත්පත්ති 17:8**
**උත්පත්ති 22:17-18**

මෙලෙස ආබ්‍රහම් දෙවියන්වහන්සේ විශ්වාස කිරීමත් උන්වහන්සේට කිකරුවීමත් නිසා දෙවියන්වහන්සේ සහ ආබ්‍රහම් අතර අන්නෝන්‍යය සබඳතාවයක් ඇති විය.

## දෙවිඳුන් සමග මිත්‍රත්වයේ වරප්‍රසාදය

දෙවියන්වහන්සේ ද ආබ්‍රහම්ව විශ්වාස කළසේක. එමනිසා ආබ්‍රහම්ට උන්වහන්සේ රහස් එළිදරව් කරන්ට කැමති වූ සේක. හොඳ මිතුරන් අතර රහස් නොමැති බව අපි දනිමු. රහස් හෙළිකරන්නේ විශ්වාසවන්තම මිතුරාට පමණයි. එමනිසා දෙවියන්වහන්සේ, **"මා කරන්ට යන දේ ආබ්‍රහම්ගෙන් සඟවම්ද?"** යි කීසේක **(උත්පත්ති 18:17)**. සොදොම සහ ගොමෝරාව යන නගර විනාශ කරන්ට පළමුව දෙවියන්වහන්සේ එය උන්වහන්සේගේ මිත්‍රයා වූ ආබ්‍රහම්ට හෙළිදරව් කළසේක. **"ස්වාමින්ගේ රහස උන්වහන්සේ කෙරෙහි භය ඇත්තන් සමගය" ගීතාවලිය 25:14**. **"සැබවින්ම ස්වාමීවූ දෙවියන්වහන්සේ තමන්ගේ රහස තමන් මෙහෙකරුවන් වූ අනාගතවක්තෘවරුන්ට එළිදරව් නොකර කිසිවක් නොකරනසේක" ආමොස් 3:7**. උන්වහන්සේට ළංව විශ්වාසවන්තව සිටින අයට සියලු දේ එළිදරව් කරන බව මෙම පදවලින් අපි දැනගනිමු. ස්වාමීවූ යේසුස්වහන්සේත් අලුත් ගිවිසුමේ මේ හා සමාන වචනයක් තමන් ගෝලයන්ට කීසේක. **"දාසයා තමාගේ ස්වාමියා කරන්නේ කුමක්දැයි නොදන්නා බැවින් තවත් නුඹලාට දාසයෝ යැයි නොකියමි. මක්නිසාද මාගේ පියාණන්වහන්සේගෙන් මා ඇසූ සියල්ලම නුඹලාට දැන්වූ බැවින් නුඹලා මාගේ මිත්‍රයෝයැයි කීමි" (යොහාන් 15:15)**. මෙවැනි ආමන්ත්‍රණයක් ලැබීමට සුදුස්සන් වීම කෙතරම් මහත් වරප්‍රසාදයක්ද?

## දෙවිඳුන් සමග මිත්‍රත්වයේ ආශිර්වාදය

දෙවියන්වහන්සේගේ මිතුරෙකු වීමෙන් ලබා ගත හැකි තවත් අගනා ආශිර්වාදයක් **උත්පත්ති 18** හි අපට දැකගත හැක. එනම් එම මිත්‍රත්වය කරණකොටගෙන දෙවියන්වහන්සේ ඉදිරිපිට යම් කෙනෙක් වෙනුවෙන් මැදහත්කාරකම් කර යාච්ඥා කළ විට උන්වහන්සේ එය අසන බවය. **උත්පත්ති 18:22-32** දක්වා කියවූ විට ආබ්‍රහම් සොදොම සහ ගොමොරාව යන නගරවල සිටි ධර්මිෂ්ඨයන් උදෙසා අත්නෑර මැදහත්කම් කළ බව පෙනේ. දෙවියන්වහන්සේද ඔහුට කන්දුන්සේක. මෙවැනිම අදහසක් තිබෙන පදයක් අලුත් ගිවිසුමේ **යොහාන් 15:15-16** යන පදවල කියවමු. ස්වාමීවූ යේසුස්වහන්සේ ගෝලයන්ට මිත්‍රයෝයයි ආමන්ත්‍රණය කිරීමෙන් අනතුරුව, **"මාගේ නාමයෙන් පියාණන්වහන්සේගෙන් නුඹලා ඉල්ලන කොයි දෙයක් නුමුත් උන්වහන්සේ නුඹලාට දෙන පිණිසය"** කියා එම මිත්‍රත්වය සනාථ කරනසේක.

දේව දරුවන් වන අපටද මෙම මහඟු වරප්‍රසාදය භුක්ති විඳිමට හැකියාව ඇත. මෙම ලිපිය කියවන ඔබ සැමදෙන දෙවියන්වහන්සේගේ නැතහොත් ස්වාමීවූ යේසුස්වහන්සේගේ මිත්‍රයා වීමට ආශා කරනවාද? මේ මහත් ආශිර්වාදලත් ගෞරවය ලබා ගැනීමට සොයනවාද? ඊට කිසිදු බාධාවක් හෝ දුෂ්කරතාවයක් නොමැත. ඔබට තිබිය යුතු හොඳම සුදුසුකම වන්නේ, ආබ්‍රහම් මෙන් සෑම වාතාවරණයකදීම දෙවියන්වහන්සේ විශ්වාස කිරීමත්, උන්වහන්සේ කියන ඕනෑම දෙයක් කිරීමට (කීකරුකම) සූදානම්ව සිටීමත්ය. **"මා නුඹලාට ආඥාකරන දේ නුඹලා කරනවානම්, නුඹලා මාගේ මිත්‍රයෝය" යොහාන් 15:14**.

මෙය ඉතාමත් සරල දෙයක් නොවේද?

**- ඈන් ජයසුන්දර -**

# යාච්ඤාව මගින් කඳුලින් ජය

මා කුඩා දරුවකුව සිටියදී කිසියම් සෙල්ලම් භාණ්ඩයක් දුටුවිට එය රැගෙන දෙන මෙන් පියාගෙන් ඉල්ලා සිටින්නෙමි. එය මගහැරීමට යමක් කීම පියාගේ සිරිතය. මාගේ ආශාව නම් මා සිත්ගත් එම ක්‍රීඩා භාණ්ඩය කෙසේ හෝ අත්පත් කර ගැනීමයි. පියාට කන්නලව්කර අවසානයේ මා අඬන්නට පටන් ගනිමි. එම ව්‍යායාමය නම් අසාර්ථක නොවේ. පසු දිනෙක හෝ මා ආශා කළ දේ මා සතු වේ. කුඩා දරුවෝ කඳුලින් ජය ගැනීමට හපන්නු වෙති.

මේ දරුවෙකුගේ අත්දැකීම අපගේ යාච්ඤා ජීවිතයටද අදාල කර ගත හැකිය. අපි යාච්ඤා කරන්නෙමු, දිනපතාම යාච්ඤා කරන්නෙමු. ස්වාමීන්වහන්සේගෙන් අපි යමක් ඉල්ලන්නෙමු. බොහෝවර එසේ කරගෙන යන නමුත් ගිරවුන් මෙන් හිස් වචන ටිකක් පිට කරනවා නම් ඉන් ප්‍රයෝජනයක් වේද? අපගේ යාච්ඤාව කැසට් පටියකට සමාන නොවිය යුතුය. සැබෑ යාච්ඤාව ආත්මයේ පතුලෙන් නැගී එන්නකි.

එය ගින්නක් මෙන් ජ්වලිතය. කඳු සොලවන තරමට ඇදහිල්ලෙන් වේගවත්ය. ස්වාමීන්වහන්සේ ඉදිරිපිට සුගන්ධ දුමයක් මෙනි. අවංක වූ එවන් යාච්ඤාවනට ආත්මයාණන්වහන්සේද මැදිහත්ව සිටින සේක **"එලෙසම ආත්මයාණන්වහන්සේ අපගේ දුර්වල කම් වලදී උපකාර කරන සේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කිරීමට අපි නොදනිමුව. නමුත් ආත්මයාණන්වහන්සේම කිව නොහැකි කෙඳිරිගෑම් වලින් අප උදෙසා මැදහත්කම් කරනසේක" (රෝම 8:26).**

යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද අපේ ඉල්ලීම් ස්වාමීන්වහන්සේට ඔප්පු කිරීමෙන් කිසි නුවණකින් දැනගත නොහැකි දෙවියන්වහන්සේගේ සමාදානය අපේ සිතුවිලි සුදුසු ලෙස හසුරුවන බව පාවුල් තුමා සඳහන් කරයි. **(පිලිප්පි 4:6)** යේසුස්වහන්සේගේ උපමා කථාවක් වන **"රාත්‍රියේ පැමිණි මිත්‍රයා"** කියවා බලන්න. එම තැනැත්තා රාත්‍රියේ පැමිණෙන විට නැගිට ඉල්ලූ දේ දීමට නිදා සිටි තැනැත්තාට බොහෝ වෙහෙස කර වුවත් ඔහු නොනවත්වාම කරන කන්නලව්ව නිසාම නැගිට අවශ්‍යය දේ සපයයි. **(ලූක් 11:5-13).** කන්නලව්ව සමග කඳුලද බොහෝවිට අත්වැල් බැඳ ගනී. නෙතින් නොසැලුනද ආත්මය හඬා වැලපේ. මෙවන් ආත්මයෙන් නැගෙන කඳුලු සහිත යාච්ඤාවේ කන්නලව්ව ඇදහිලිවන්තයාට විශිෂ්ඨ ජයග්‍රහණය අත්පත් කර දෙයි.

ඇයි මෙලෙසින් යාච්ඤාවෙන් පොර බැදීමක් අවශ්‍ය වන්නේ? උන්වහන්සේට එක්වරක් පැවසුවාම ඇදහිල්ල ඇතිව නොසෑහේද? මෙවන් සිතුවිල්ලක් ඔබ තුල පහල වීමට බැරි නැත. යම් පුද්ගලයකුගෙන් සෑහෙන්න මුදලක් ඉල්ලා ගැනීමට අවශ්‍යව තිබේ යැයි සිතමු. එම තැනැත්තා වෙත ගොස් "මට මෙපමණ මුදලක් අවශ්‍යය වී තිබෙනවා. කරුණාකර එය මට දෙන්න". යයි පවසා ඔබ නිහඬ වන්නේද, එම තැනැත්තා ඔබේ හිතවතෙක් විය හැකිය. එහෙත් ඔබ ඉල්ලා සිටින ආකාරය අනුව සමහර විට අවශ්‍යතාවය ඉටු නොවීමට පුළුවන. එසේ

නොව, පළමුව ඔබ ඔහු සමඟ සුහදව කතා කරයි. ඒ සමඟ ඔබට මුදල් අවශ්‍ය වීඇති කාරණයේ බැරෑරුම් කම විස්තර කරනවා ඇත. ඔහුගේ විශ්වාසය ඔබ කෙරෙහි යොමුවන අන්දමින් ඔබේ වචන හසුරුවනවා ඇත. ඔබේ ඉල්ලීම ඉටු කිරීමට ඔහු යොමුවේ. ඉහත නිදසුනෙන් ස්වාමීන්වහන්සේගේ පාමුල කන්නලව් කිරීමේ අදහස ඔබට වැටහෙනවා ඇතැයි මම සිතමි. ස්වාමීන්වහන්සේගේ මහිමය, බලය ගැන මෙනෙහි කරමින්, ප්‍රශංසාවෙන් යුක්තව ස්වාමීන්වහන්සේට කන්නලව් කිරීම මගින් මහත් දේ සිදුවෙයි. මගේ ජීවිතයේ මා ගත කරන තෘප්තිමත්ම වේලාව ස්වාමීන්වහන්සේගේ පාමුල ගත කරන අවස්ථාවයි. එහිදී මා ලබන සැනසුම, සුවය, සතුට, සහනය කියා නිම කළ නොහැක.

කඳුලු අතරින් ජයගත් කීප දෙනෙකුගේ අත්දැකීම් ශුද්ධ ලියවිල්ලේ පිටු අතරින් අපි සොයා බලමු. පළමුවෙන් අපගේ අවධානය යොමුවන්නේ හෙසකියා රජු වෙතය. **(යෙසායා 38 වන පරිච්ඡේදය හා රාජාවලිය 20)** හෙසකියා රජු ස්වාමීන්වහන්සේට ඇලුම්ව හැසිරුණ බව සඳහන් වී තිබේ. වරක් ඔහු මරණාසන්න වන තරමටම රෝගාතුර විය. යෙසායා අනාගතවක්තෘ හෙසකියා රජුවෙත පැමිණ "මෙම රෝගයෙන් ඔබ මිය යන බැවින්, ගෙදර කාරණා බේරා තබන ලෙස ස්වාමීන්වහන්සේ පවසන සේකැයි" කීවේය. ස්වාමීන්වහන්සේගේ මෙම වේදනාකාරී පණිවිඩය ඇසූ හෙසකියා රජු කලේ කුමක්ද? ඔහු බිත්තිය දෙසට මුහුණ හරවාගෙන ස්වාමීන්වහන්සේගේ පාමුල හඬා වැලපෙමින් යාච්ඤා කළේය.

**"අහෝ ස්වාමීන්වහන්ස, මා සැබෑකමිනුත්, සම්පූර්ණ සිතකිනුත් ඔබ ඉදිරියේ හැසිර, ඔබගේ ඇස් ඉදිරියේ හරිව තිබුණ දේ කල බව සිහි කල මැනව"**. ඔහු එසේ යාච්ඤා කරන්නට පටන් ගත්තේය. ප්‍රේමවන්ත සහෝදර, සහෝදරිය ඔබටත් ස්වාමීන්වහන්සේ ඉදිරියේදී එවැනි ප්‍රකාශයක් කළ හැකිද, එසේ නොහැකි නම්, අපට එවන් ප්‍රකාශයක් කරන්නට හැකි වන අයුරින් අපගේ ජීවිත පිළියෙල කර ගැනීමට අප උනන්දු වෙමු.

හෙසකියා යාච්ඤා කරන අතර, යලි ස්වාමීන්වහන්සේගෙන් පණිවිඩයක් යෙසායා අනාගතවක්තෘ මගින් ඔහු වෙත පැමිණියේය.

**"මම නුඹේ යාච්ඤාව ඇසීමි. නුඹේ කඳුලු දුටිමි. නුඹේ වයසට තව අවුරුදු 15ක් එකතු කරන්නෙමි. මම අෂූර් රජුගේ අතින් නුඹ ගලවා නුඹ සහ මේ නුවර ආරක්ෂා කරන්නෙමි" (යෙසාය 38:5).**

ස්වාමීන්වහන්සේ මේ දේ ඉටු කරන බවට ලකුණක් පවා දුන්සේක. එනම් සූර්යයා බැස ගිය තැනින් අංශක දහයක් ආපස්සට හැරී ඒමට සැලැස්වීමයි. මෙම සිදුවීමෙන් අපට දෙවිපියාණන්වහන්සේ පිළිබඳ උතුම් ගුණාංගයක් අවබෝධ කර ගනිමු. එනම් ස්වාමීන්වහන්සේ අපට දක්වන ප්‍රේමය කෙතරම්දයත්, අප ස්වාමීන්වහන්සේට සමීපවන්නේ නම් අපට නියමව තිබෙන යම් විනිශ්චයක් පවා ඉවත් කරන්නටත් ඒ වෙනුවෙන් මහත් සේ ආශිර්වාද කරන්නටත් උන්වහන්සේ සූදානම් බවයි. සහෝදර සහෝදරියනි, ඔබගේ ජීවිතයේ ඇති දුක් කරදර අභියෝග, බාධක යාච්ඤාව තුලින් ජය ගැනීමට හැකි බව මතක තබාගන්න.

**- ගුරුහරු -**

# අම්හිරිවූ, මිහිරි සුවය

සුපුරුදු දෙසැම්බර් 31 වැනි දින, මධ්‍යම රාත්‍රී නමස්කාර මෙහෙයට අවුරුදු ගණනාවක් ස්වාමීන්ට ගීතිකා කර ඇතත්, කුමක්දෝ හෙයකින්, පසුගිය 2021 දෙසැම්බර් 31 වැනි දින ගීතිකා කරන්නට හෝ සභාවට යාමට නොහැකි වූයෙමි.



මන්දයත් එදිනම දහවල් වරුවේ මා කොවිඩ් 19 පොසිටිව් රෝගියෙකු වූ බැවිනි. මෙම දිනයන් තුල විවිධ වේදනාකාරී සංකූලතා පහලවූයෙන් ජනවාරි පළමුදින කළුබෝවිල මහ රෝහලට ඇතුලත් වූයෙමි.

පළමු සතිය ඉතා අම්හිරි අත්දැකීම් සමූහයකි. ශාරීරික වේදනා සහ හුස්ම ගැනීමේ අපහසුතාවය වැනි රෝග උත්සන්නවූ හෙයින්, දැඩි සත්කාර ඒකකයට ඇතුලත් කරන ලදී.

එවිට මාගේ සභාවේ සහෝදර සහෝදරියන් ඉතා කනස්සල්ලට හා කලබලයට පත්වූ අතර මා වෙනුවෙන් දම්වැල් යාච්ඥාවක් ද ආරම්භ කළේය.

රෝහලේ අපහසුවෙන් සිටියදීත්, බදාදා දිනයන්හී දුරස්ථ ක්‍රමයට පවත්වන යාච්ඥා මෙහෙයන්ට ස්වල්ප මොහොතකට සහභාගීවී, ඔවුන් මා වෙනුවෙන් කරන යාච්ඥාවන්ට සවන් දුන්නෙමි.

තවද මා හට ප්‍රේමකරන පිටත සභාවන්හි සහෝදරයින්ද, විදේශ රටවල සිටින මා හදුනන කිතුණු හිත මිත්‍රාදීන්ද, මාගේ ජීවිතය නැවත දෙන ලෙස ස්වාමීන්වහන්සේට උදක්ම කන්නලව් කල අතර සමහරු නිරාහාරශීලිවද යාච්ඥා කල බව මට පසුව ආරංචිවිය. **පිලිප්පි 4:6-7, ගීතාවලිය 107:28-30** මේ අතරවාරයේදී මාගේ බිරිද වන ශාමිනිටද කොවීඩ් පොසිටිව් වූ හෙයින් රෝහලට ඇතුලත් කල අතර ස්වල්ප දිනයකින් නැවත පැමිණියද, දරුවන් දෙදෙනා (රූත් / ජෙහාන්) පමණක් සියලු නිවසේ කටයුතු උරමතට ගෙන කටයුතු කළහ. නිවසට ඇතුල්වන්නට හෝ බැහැර වන්නට නොහැකි වන සේ සෞඛ්‍ය පරීක්ෂක විසින් දැන්වීම් දින 14කට අලවා තිබුණි. තද ඇදහිල්ල සමඟ යාච්ඥාව අපේ සෑම ප්‍රශ්ණයකටම සෑම රෝගයකටම විසඳුමයි.

ඔබ **ක්‍රියා පොතේ 12 පරිච්ඡේදය, පද 1 සිට 17 දක්වා** කියවා ඇති බව දනිමි - පේතෘස්ගේ හිරෙන් නිදහස්වීම පුදුම සහගතය. මන්දයත් සාමූහික යාච්ඤාවේ ප්‍රතිඵල නිසාවෙනි.

නිදාගැනීමේදී පවා ඔක්සිජන් බටය නාස්

පුඩුවලට ඇතුලත් කරගෙන සිටීමත්, එක් අතක රුධිර පීඩන පටියත්, අනෙක් අතක එන්නත්කරණ කටුව (කොපුව) පැළදගෙන නිදාගැනීම ලේසි පහසුද නැත. උඩුබැලි අතටම සිටිය යුතුය. ගන්නාවූ සැර බෙහෙත් වර්ග නිසා, රාත්‍රිය නිදිවර්ජිතය. මේ සියල්ල මධ්‍යයේ, මෙලොව මනුෂ්‍ය ජීවිතයේ නිසරු බව හා දෙවියන්වහන්සේ සමඟ සදාතන ජීවිතයේ සාරවත් බව අපූර්වත්වය මෙනෙහි කිරීමට කාලය මිඩංගු කළෙමි. ස්වාමීන්වහන්සේගේ දිව්‍යමය පොරොන්දු වල සත්‍යතාවයත්, ජීවිතය තුල සැබෑවීමත්, විවිධාකාරයේ සිදුවීම් තුලින් තව තවත් ඔප්පුවිය.

නිදිවර්ජිත කාලයන්හි, ගිලන් යහනේ සිට ප්‍රශංසා හා ගීතිකා වලට සවන්දීමත්, දිරිගැන්වීමේ සිතුවිලිවලට සවන් දීමටත් මා වෙනුවෙන් යාච්ඤා කරන අයවලුන්ගේ පවුල් ගැන නම් වශයෙන් යාච්ඤා කිරීමටත් මා පෙළඹුනෙමි.

එවිට උන්වහන්සේ මට **ගීතාවලිය 27** වන පරිච්ඡේදය හරහා යම් සංඥාවක් ලබා දුනි.

**"උන්වහන්සේ මාගේ ආලෝකයය / ගැළවීම බවත්, මා කාට භයවන්නද? මාගේ ජීවිතයේ ශක්තිය ස්වාමීන්වහන්සේ බැවින් මා කාට භීත වෙන්නද?"** යන්නයි මට ශක්තිය ගෙනා පාඨය මෙය විය. එසේම උන්වහන්සේ **ගීතාවලිය 27:5** පදය පොරොන්දුවක් හැටියට දුනිමි / මා සිතට තදින් කා වැද්දුවෙමි.

එනම් : ***උන්වහන්සේ මාව විපත්ති දවසේදී ස්වකීය විමානයේ වසා තබන බවත්, ස්වකීය මණ්ඩපයේ, කාහටත් නොපෙනෙන ස්ථානයක මා සඟවා තබන බවත්, පසුව උන්වහන්සේ මා උස්වූ කදු මුදුනක ඔසවා තබන බවත්ය.***

කෙසේවුවද දින 18 ට පසුව නිවසට පැමිණීමේ භාග්‍යය උදාවූ අතර, මේ සියලු කාරණාවලදී මා හට උපකාර පිණිස මාගේ ආත්මික සහෝදරයන් සමූහයක් ඉදිරිපත්වීම ඉතා භාග්‍යයක් කොට සලකන අතර ඔවුන් ගැන ස්වාමීන්වහන්සේට ස්තූතිවන්ත වෙමි. ඔවුන් දිවා රෑ නොබලා මාගේ සුවය හා සුව පහසුව වෙනුවෙන් වෛද්‍යවරුන්ට දෙවැනි නොවන සේවාවක් ඉෂ්ඨ කළෝය. මේ සියල්ලේදී මාගේ ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මටත්, මාගේ දරු පවුලටත් ළංව සිටියේය. සියලු ගෞරවය උන්වහන්සේට පුදකරමි.

මේ දේවල් කෙසේවෙතත් අප විසින් දැනගතයුතු කරුණ තමයි අප ජීවිතවල "සුවය" තාවකාලික බවත්, එක් රෝග යකින් සුවවී තවත් රෝගයකින් අපගේ ජීවිත කෙළවර විය හැකි බව. මන්ද අප ජීවිතය දිනපතා දිරායමින් කවදා හෝ පොළොවට පස්වන බව. නමුත් ක්‍රිස්තුස්වහන්සේ මුලු සිතින් අදහන්නාවූ මට හෝ ඔබට, එය සදාකාලයට " ජීවත්වීමේ දොරටුව" බව අමතක නොකළ යුතුයි.

**"එබැවින් යහපත් කමත් කරුණාවත් මාගේ ජීවිතයේ සියලු දවස්වලදී මා අනුව එන්නේය. මම සදාකල්ම ස්වාමීන්වහන්සේගේ ගෘහයෙහි වාසය කරන්නෙමි" (ගීතාවලිය 23:6).**

**- රවීන්ද්‍ර ජයලත් ද සිල්වා -**

# දිනපතා ආත්මික ව්‍යායාම

★ දිනපතා බයිබලය කියවන්න.

★ දිනපතා වේලාවක් වෙන් කරගෙන යාච්ඤා කරන්න.

★ දිනපතා දෙවියන්වහන්සේට ස්තුති, ප්‍රශංසා, නමස්කාර කරන්න. (නිවසේදී)

★ සෑම ඉරුදිනකම සභාවට යන්න.

★ ඔබගේ ආදායමෙන් දෙවියන්වහන්සේගේ කොටස වෙන් කර පූජා කරන්න.

★ සෑම විටම අන් අයට යහපත් ක්‍රියාවන් කරන්න.

★ සෑම විටම සුභාරංචිය තව කෙනෙකුට සරලව පවසන්න.

www.christianfellowshipcentre.com

Cfc Colombo (Christian Fellowship Centre)

CFC Colombo


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**

අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com



NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com